Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2018.05.02

පැමිණිලිකරු : ඒ.ඒ සම්පත් මයා,
23/6 ඒ, මල්ලිකා පටුමග,
කොළඹ 06.

වගඋත්තරකරුවන් : 1. විදුහල්පති.
රාජකීය විද්‍යාලය.
කොළඹ 07.

2. සභාපති.
අභියාචනා මණ්ඩලය.
රාජකීය විද්‍යාලය.
කොළඹ 07.

3. අධ්‍යක්ෂ (ජාතික පාසැල්).
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

පැමිණිලි අංකය : **HRC/75/18**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනුකරමින්. තම දරුවා වන ඒ.ඒ හර්ෂල් ඩෑන් දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ 2018 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර 2017.08.31 වන දින සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ලද බවත් ආසන්නතාවය පදනම යටතේ යොමු අංක ආර්සී/එස්/18/6300 යන අංකය යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට චක්‍රලේඛ ප්‍රකාරව.

ඡන්ද නාම ලේඛනයට ලකුණු 30

පදිංචිය තහවුරු කිරීමේ ලේඛන ලකුණු 5

ලියාපදිංචි බඳු ඔප්පුව සඳහා ලකුණු 6 ක්ද උපයාගන්නා ලද බවත්. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සිතියම අනුව පාසැල් 6 ක් සඳහා ලකුණු අඩුකළ බවද සඳහන් කර ඇත. තවද

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrc@sltnet.lk

පැමිණිලිකරු ක්‍රිස්තියානි භක්තිකයෙකු හේතුවෙන් ක්‍රිස්තියානි ධර්මය ඉගැන්වීම නොකරන පාසැල් එම පාසැල් 9 අතරට ඇතුළත් වන බවත් ඒ සඳහා ලිඛිත සාක්ෂියක් නොමැති නිසා ලකුණු ලබා දීමට නොහැකි බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් කියා සිටින ලද අතර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ අත්සනින් ඉදිරිපත් කරන ලෙස දන්වන ලද බවත්ය.

තවදුරටත් පැමිණිලිකරු ඔහුගේ පැමිණිල්ලේ සඳහන් කර ඇත්තේ. 22/2007 චක්‍රලේඛනය ප්‍රකාර (තමා අදහන ආගම සඳහා 10%කට වඩා අඩු ප්‍රතිශතයක් ළමුන් ඇතුළත් කර ගන්නා පාසල අඩු නොකිරීම) පාසැල් 3 ක් ඇතුළත් කර කළාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ අත්සනින් යුත් ලිපියක් 2007.09.15 දින පාසලේ විදුහල්පතිතුමා ඇතුළු පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද බවයි. එසේම පාසල් තුනක් සඳහා ලකුණු 15 ක් එකතු කර මුළු ලකුණු 61 ක් බවට පත්කර එම ලකුණු වාර්තාව පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමාගේ අත්සන සහිතව තමා වෙත ලබා දුන් බවද සඳහන් කර ඇත. තවද එම ලකුණු 61 ක් සහිත තමාගේ නම තාවකාලික ලැයිස්තුවේ සඳහන් කර 2017.11.15 දින ප්‍රසිද්ධ කරන ලද බවද සඳහන් කර ඇත. නමුත් තම දරුවා 2018 වර්ෂයේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට අවස්ථාව නොලැබුනු බවද දක්වා ඇත.

ඒ අනුව කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් වීමට තම දරුවාට ඇති අවස්ථාව ලකුණු 61 ක් මත හිමි බව තහවුරු කර පාසලට ඇතුළත් වීමට ඇති අවස්ථාව ලබා දෙන ලෙසට ඉල්ලා සිට ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

මෙම පැමිණිල්ලට අදාළ පරීක්ෂණයේදී කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද ලිපිලේඛන පරීක්ෂා කිරීමෙන් පසු ලකුණු 61 ක් ලබා දී දරුවාගේ නම තාවකාලික ලේඛනයේ ඇතුළත් කළ බවයි. පසුව අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වූ විරෝධතාවයන් දෙකක් හේතුකොටගෙන අභියාචනා මණ්ඩලය විසින් එම ලකුණු පිළිබඳව ගැටළු සහගත බවක් දන්වා තිබූ අතර විරෝධතා මණ්ඩලයේ එක් සාමාජිකයෙකු ඔහුගේ අත්සනට යටින් මෙම දරුවාගේ නම සහිත අයදුම්පත් අංකය යොදා ඒ සම්බන්ධව ඔහුගේ විරෝධතාවයක් ඇති බවට සටහන් කරන ලද බවත් දක්වා ඇත. එවැනි ලේඛනයක් අවසාන නාම ලේඛනයට ඉදිරිපත් කිරීමට නොහැකි බැවින් විදුහල්පතිවරයා එම දැනුම්දීම අනුව අභියාචනා මණ්ඩලයේ ඉහත පාද සටහන වෙනස් කිරීමක් හෝ වෙනත් විකල්ප තීරණයක් ඉදිරිපත් කරන ලෙස අභියාචනා මණ්ඩලයට දැනුම් දී ඇති බවද ඉන් පසුව ඔවුන් අදාළ දරුවාගේ නම අවසාන ලේඛනයෙන් ඉවත් කර සාමාජිකයින් 5 දෙනාම සහතික කරන ලද අවසාන ලේඛනය ප්‍රදර්ශනය සඳහා පාසලට භාරදෙන ලද බවද සඳහන් කර ඇත.

තවද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් වන 1 වන වගඋත්තරකරු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති ලකුණු සම්බන්ධව සහ ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද කලාප අධ්‍යක්ෂකගේ ලිපිය පිළිබඳ සෑහීමකට පත්වූ බැවින් අදාළ ලකුණු සම්බන්ධව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත්වූ බව ප්‍රකාශ කර ඇත.

මෙහිදී පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, තමාට එරෙහිව පොදු විරෝධතා දෙකක් ඉදිරිපත් වී ඇති බැවින් අභියාචනා මණ්ඩලය කැඳවූ අතර එහිදී පෙර ලකුණු 61 වෙනස් නොකළ බවත් සියළු ලිපිගොනු නැවත පරීක්ෂා කරන ලද අතර ඉතා සුහදශීලීව අභියාචනා මණ්ඩලයේ එකඟතාවය පළ කරන ලද බවත්ය. නමුත් අභියාචනා මණ්ඩලය විසින් තමා හට පැමිණෙන ලෙස දුරකථනයෙන් දැනුම් දී චක්‍රලේඛනයට අනුව ලකුණු ලබා දිය නොහැකි බවත් අබේසිංහ සම්පත් වන තමාගේ නම සිංහල බෞද්ධ නමක් බවත් තමා උත්පත්තියෙන් ක්‍රිස්තියානි භක්තිකයෙකු නොවන බැවින් ලකුණු ලබාදිය නොහැකි බවත් පවසන ලද බවද සඳහන් කර ඇත.

නිරීක්ෂණ :-

මෙම පැමිණිලිකරු 2018 වර්ෂයේ පළවන ශ්‍රේණියේ කොළඹ රාජකීය විද්‍යාලයට ඔහුගේ දරුවාව ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් පාසලට ආසන්නතා ගණය යටතේ ඉදිරිපත් කර 2018.08.31 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පෙනී සිට ඇත.

එහිදී පැමිණිලිකරුට ඡන්ද නාම ලේඛනයේ නම ඇතුළත් වීමට ලකුණු 30ක්ද. ලියාපදිංචි බදු ඔප්පුවට ලකුණු 6ක්ද. අතිරේක ලේඛන වලට ලකුණු 5ක්ද. ආසන්නතාවයට ලකුණු 20ක්ද. වශයෙන් මුළු ලකුණු 61 ක් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම ගණය යටතේ මෙම පාසලට ළමුන් ඇතුළත් කරගත්තා වූ කඩඉම් ලකුණ වන්නේ ලකුණු 51 ක් වන අතර ලේඛන පරීක්ෂා කිරීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු 61 ක් තහවුරු කිරීමෙන් අනතුරුව තාවකාලික ලැයිස්තුවට පැමිණිලිකරුගේ දරුවාගේ නම ඇතුළත් කර ඇති බවත්. පැමිණිලිකරුට එරෙහිව තිබූ විරෝධතා දෙකෙන් අනතුරුව අභියාචනා මණ්ඩලයේ ලේඛන පරීක්ෂා කිරීමේදී එම ලකුණු 61 තවදුරටත් ස්ථිර කර ඇති බවද නිරීක්ෂණය වේ.

අබේසිංහ ආරච්චිගේ සම්පත් යන නම සිංහල නමක් බවත් එබැවින් පැමිණිලිකරු මෙම ගණය යටතේ ඉල්ලීම් කිරීමට සුදුසුකම් නොලබන බැවින් පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම අභියාචනා මණ්ඩලය විසින් කර ඇති බවත් සඳහන් කර ඇත. මෙහිදී කෙනෙකුගේ නම සිංහල නමක් වීම මත පමණක් ඔහු බෞද්ධාගමිකයෙකුද ක්‍රිස්තියානි ආගමිකයෙකුද යන්න තහවුරු කිරීම නීත්‍යානුකූලව නිවැරදි ක්‍රියාමාර්ගයක් නොවන අතර මෙහිදී පැමිණිලිකරු ඔහුගේ බිරිඳ සහ දරුවා The Pentecostal Assemblies of Sri Lanka යන නිකායට අයත් වන බවට සඳහන් කරමින් එම නිකායේ ප්‍රධානී පාස්ටර් රෙවරන්ඩ් එස්. රෙබේකා ෆර්ඩිනැන්ඩෝ මහතා විසින් ලබා දී ඇති බෞතීස්ම සහිතකයද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

එබැවින් අභියාචනා මණ්ඩලයේ සාමාජිකයින් කෙනෙකුගේ නම පමණක් පදනම් කරගෙන ඔහුගේ ආගම හෝ ඔහු අදහන ප්‍රතිපත්තිය තීරණය කිරීම සාධාරණ නොවන බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

ඉහත කී කරුණු අනුව පැමිණිලිකරු ක්‍රිස්තියානි ආගමිකයෙකු බවත් ඔහුගේ බිරිඳ සහ දරුවා අදහනු ලබන්නේද ක්‍රිස්තියානි ධර්මය බවත් පැහැදිලි වන අතර. වගඋත්තර පාසලට ආසන්නතා ගණය යටතේ අයදුම්පත්‍රය ඉදිරිපත් කර ලකුණු 61 ක් ලබාගෙන ඇති බවත් එම ලකුණු 61 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා පරීක්ෂණ මණ්ඩලය වෙතින් තහවුරු වී ඇති බවත්. පාසලට එම ගණය යටතේ ගන්නා වූ කඩඉම් ලකුණු වන්නේ ලකුණු 51 බවත් ඒ අනුව පැමිණිලිකරුගේ දරුවාට 2018 වර්ෂයේ පළවන ශ්‍රේණියට ඇතුළත් වීමට සඳහා සුදුසුකම් සම්පූර්ණ වී ඇති බවත් කොමිෂන් සභාව නිගමනය කරනු ලබයි.

ඉහත සමස්ථ කරුණු අනුව. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලබයි.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා වන ඒ.ඒ. හර්ෂල් ඩෑන් දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ 2018 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

2018.06.02 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 04.

B/